# පුංචි පැළේ ගස වෙනා



සෙතුම් ලෝමෙත් ඒකනායක

# පුංචි පැළේ ගස වෙනා



සෙතුම් ලෝමෙත් ඒකනායක



ප්‍රථම මුද්‍රණය : 2025-02-08

පොතේ නම : පුංචි පැලේ ගස වෙනා

කර්තෘ : සෙතුම් ලෝමෙත් ඒකනායක

කර්තෘගේ වෙනත් කෘති : සෙතුම්ගේ කවි සිතුවිලි (2023)

පන්තිය : 3 ශ්‍රේණිය R

පාසල : කිංස්වුඩ් විද්‍යා මහනුවර

ISBN අංකය : 978-624-208

# පිදුම

පුංචි ම පුංචි රස හීන දකින,
පුංචි පුතෙක් වූ මට
පණ මෙන් ආදරය කරන,
හරි ම හරි දේ හරියට කියාදෙන,
මගේ ආදරණීය අම්මාට......
හදවතේ ගැඹුරුම තැනින්
මට සෙනෙහස දෙන,
මගේ ආදරණීය අප්පච්චි ට.....
දහකාර සිසුවෙකු වූ මගේ
ආදරණීය දහ වැඩ ඉවසන
ආදරණීය
අනූෂා මැඩම්
සන්ධ්‍යා මැඩම්ට
රුචිරා මැඩම්ට
මගේ ආදර ලොකු අත්තා ට
දිව්‍ය ලෝකයේ ගොස් සිටින
අත්තම්මලා දෙදෙනාට, ලොකු සීයාට

***පුංචි පැලේ ගස වෙනා***

ආදරයෙන් පුදමි........

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේ ම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම පාසලේ ආදි කතෘ කරුණ අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩ නගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණ ගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිණිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම, පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගැනීමෙන් ලේඛණ කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමාන ය.

විදුහල්පතිණිය,<br>
ශශිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විදුහල,<br>
මහනුවර.

# ස්තූතිය

වෙන කාටවත් නැති තරම් හොඳ ම හොඳ දේ දෙන,
දකින හැමදේම සියුම් පරීක්ෂාවෙන් බලන්නට
මගේ ඇස් හුරු කරන,
මගේ ආදරණීය අම්මාට....... අප්පච්චීට........
මගේ ආදරණීය අනූෂා මැඩම්ට, සන්ධ්‍යා මැඩම්ට,
මගේ ආදරණීය ඉස්කෝලේ යාළුවන්ට,
වෙස්,කරාතේ,පිහිණුම්, ක්‍රිකට් ක්‍රීඩාවල යෙදෙන මගේ
එකමුතු යාළුවන්ට,
කිංස්වුඩ් විදුහල් මාතාවට,
මෙම පර්යේෂණ කෘතිය
ලිවීමට අදහස ලබාදුන්,
මහාමායා ප්‍රාථමික විදුහලේ පර්යේෂණ ඒකකය ඇරඹීම
වෙනුවෙන් මගේ අම්මාට සහ එහි පර්යේෂණ කණ්ඩායමේ
අක්කිලාට,
කිංස්වුඩ් විද්‍යාලයේ පර්යේෂණ ඒකකයේ අයියලාට,
**ISBN** අංකය රැගෙන දුන් මහාමායාවේ ආදරණීය සතිනි
අක්කීගේ අම්මාට,
'මහාචාර්ය පූටන් වන් වන්න' සෙතුම් කියමින් මා
දිරිමත් කළ, ළමයින්ට රස පොත් ලියන වෛද්‍ය නුවන්
තොටවත්ත මාමාට,
(පොත් සර්) සෙනෙවිරත්න ගුරුතුමාට,
මගේ ආදරණීය ලොකු අත්තාට.......

ස්තූතිවන්ත වන්නෙමි.

## 2024 ජනවාරි 18

ලොකු අත්තා ගෙනැවිත් දුන් මිරිස් ඇට පැකැට්ටුවේ ඇට පැළ කිරීමට සිතුවා. අම්මා ඒ සඳහා මට උදව් කළා. ඒ සඳහා නිවසේ සකස් කළ කොම්පෝස්ට් පොහොරවලට මතුපිට පස්, වැලි එක්කර පොහොර මිශ්‍රණය සකස් කර ගත්තා.



## 2024 ජනවාරි 19

සකස් කර ගත් බඳුන්වල මිරිස් ඇට පැළ කළා. මිරිස් ඇට වැසෙන සේ පස් යෙදුවා. ජලය ප්‍රමාණවත් පරිදි යෙදුවා. (පැළ එලියට එනකම් මට ඉවසිල්ලක් නැහැ) දවස ගානේ බලන්න ඕනේ.



## 2024 ජනවාරි 23





ජලය ස්වල්පය බැගින් යොදමින් දිනපතා බඳුන නිරීක්ෂණය කළත් අද තමයි සතුටු දෙයක් දැක්කේ. චූටි ම චූටි පැළ දෙක තුනක් පස් අතරින් එළියට ඇවිත්....

ඒවායේ උස මැන්නා.

2mm පමණ වුණා.

මට හරි ම සතුටුයි.

## 2024-01-27



අද නම් සතුටු දවසක්. පුංචි පැළ ගොඩක් මතු වී තිබුණා.

පැළ ගණන් කළා. 13 ක්.. පැළවෙලා.

එකක් උස 4mm තරම් වුණා.

මිරිස් ඇට දෙක තුනක් පැළවී නැහැ.. වගේ.

පැකට්වල තියෙන සමහර ඇට නිරෝගී නැහැ.

පැළ නොවන ඒවා තියෙනවා. අම්මා කිව්වා.

## 2024 ජනවාරි 29



බඳුන්වල මිරිස් පැළ වැඩි ප්‍රමාණයක් පැළවී තිබුණා.මිරිස් පැළ සියල්ල බඳුනේ එක් පැත්තකට නැමී තිබෙන අයුරු දුටුවා. ඒ ඇයි...? මම අම්මාගෙන් ඇසුවා. ආවරණයක් ඇති තැනක තැබූ නිසා පැළ හිරු එළිය ඇති දෙසට  නැමී ඇති බව අම්මා කිවුවා. හරි පුදුමයි...

පැළ බඳුන ආවරණයෙන් පිටතට ගෙන හිරු එළිය ප්‍රමාණවත් ව වැටෙන තැනක තබා ජලය යෙදුවා.

මාසය පුරා ම දිනපතා නිරීක්ෂණයේ යෙදුණා. ජලය යෙදුවා. පැළ සෙමෙන් වැඩෙන ආකාරය දැක්කා. මට සතුටුයි.

**2024 පෙබරවාරි 13**



අද උදයේ බඳුන්වලට දැමූ ඇටවලින් පැළ සෑදී අවසන් බව දුටුවා.

පැළයක් උස මැන බැලුවා. 10cm පමණ වුණා.

<u>**2024 පෙබරවාරි 15**</u>



සුදුසු භාජනවල පැළ සිටුවීමට දැන් සූදානම්.

ඉවත ලන ප්ලාස්ටික් බඳුන් මැටි හට්ටි වලින් සැකසූ භාජනවලට පොහොර යොදා සකස් කළා.

අතින් වළවල් දෙක බැගින් හාරා පැළ දෙකක් බැගින් සිටවූවා.

සිදුරු සහිත භාජනයකින් ප්‍රවේශමෙන් ජලය වත්කළා.

හැමදාම බලන්න ඕන මොකද වෙන්නේ කියලා.. මම හිතුවා.

## 2024 පෙබරවාරි 26

අද සිට තෝරාගත් එක් පැළයක වැඩීම හොඳින් නිරීක්ෂණය කළා. පැළ තරමක් වැඩී තිබුණා. පැළ දෙකක කොළ කීපයක් ඇඹරී තිබුණා. පණුවන් සිටීදැයි බැලුවත් කිසිවෙක් සිටියේ නැහැ. අව්වට වෙන්න ඇති අම්මා කිව්වා. තෝරාගත් පැළය හොඳින් වැඩෙමින් තිබුණා.





## 2024 මාර්තු 12



මිරිස් පැළය ටිකක් උසවෙලා. උස අඩියකට ආසන්නයි.
අදත් වතුර දැම්මා.



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජංගම අලෙවි සැළෙන් මිලදී ගත් කාබනික පොහොර අවශ්‍ය ප්‍රමාණයට පැළවලට යෙදුවා.

## 2024 මාර්තු 20

අද හරිම සතුටු දවසක්... තෝරාගත් මිරිස් පැළයේ සහ අනෙක් මිරිස් පැළවල මල් එක දෙක පිපෙන්න පටන් අරන්. ඒ මල් සුදු පාටයි. චූටි මල් පොහොට්ටු හරි හැඩයි.

පැළයේ උස අඩියක් පමණ වුණා.
සමහර පැළවල මල් දෙක තුනක් පමණ පිපී තිබුණා.
හරිම ලස්සනයි.
'එයාලා එල දරන්නයි ඔය සූදානම් වෙන්නේ'
අම්මා කිව්වා. පැළවලට කොම්පොස්ට් පොහොර දැම්මා.



## 2024 අප්‍රේල් 3

මිරිස් පැළයේ කුඩා කරල් දෙකක් ඇවිත්... ඒවා ළා කොළ පාටට හුරුයි. හරි ම ලස්සනයි. හැම පැළයක ම මල් පිපිලා.
මට සතුටුයි.





## 2024 අප්‍රේල් 13

පැළවල කරල් දෙක තුන හැදිලා. අලුතින් මල් පිපිලා.
කරලක දිග 2cm විතර වුණා. හැමදාම හවසට බලන්න ඕන. මම හිතුවා.





2024 මැයි 6

මිරිස් කරල් ගොඩක් හැදිලා. අස්වැන්න නෙළාගන්නට පුළුවන්.

මගේ ගොටුකොළ පාත්තියෙන් උදේ නෙළාගත් ගොටුකොළ ටික මතක් වුණා.

ඒ ගොටුකොළ වලින් සම්බෝලයක් හදන්න අද මගේ මිරිස් එලදාව යොදාගන්න පුළුවන්.. මම අම්මාට කිව්වා...

අම්මා ඇවිත් වැඩුණු මිරිස් කරල් කීපයක් තෝරා දුන්නා.

ඒවා ප්‍රවේශමෙන් නෙළාගෙන අම්මාට දුන්නා. මට සතුටුයි.

අම්මා හැදූ ගොටුකොළ සම්බෝලය රසවත් වුණේ පුතාගේ ගස්වලින් කැඩූ මිරිස් යෙදූ නිසා බව අප්පච්චි කියූ විට මට සතුට වැඩිවුණා.

මිරිස් ඇටයක් මිරිස් කරල් දෙන පැළයක් දක්වා වැඩීමේ ආකාරය නිරීක්ෂණය කිරීම කොතරම් රසවත් අත්දැකීමක් දැයි මට සිතුණා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත්, අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත්, සාහිත්‍ය නිර්මාණකරනය විභවතා කොට ගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප, පළාත්, ජාතික, සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධකර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයක් එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු, ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේ ම පාසල් දරුවන් සමඟ ඒකව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යැමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ,

සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

**2025-02-08**